කන්තලේ ප්‍රාදේශීය සභාව
-----------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
--------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 වැනි දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කන්තලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂයේදී ඉදිකරන ලද නගර ශාලාවේ වටිනාකම රු.70,671,580 ක් වුවත් එය රු.72,000,000 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ගොඩනැගිලි රු.1,328,420 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු. 267,124 ක් වුවද, එය රු. 204,960 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වගකීම් රු. 62,164 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු රැඳවුම් මුදල් රු.7,903,352 ක් වුවත් එය රු.7,874,938 ක් ලෙස දැක්වීමෙන් ජංගම වගකීම් රු.28,414 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 59 | සෑම වර්ෂයක් ආරම්භයේදී ම සභාබල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396 | නිකුත් කර මාස 06 ඉක්මවා තිබූ ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ රු. 348,336 ක් වටිනා චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 13 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,878,731 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,959,735 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 4,300 | 3,759 | 3,830 | 9,471 | 2,800 | 3,607 | 2,708 | 9,563 |
| (ii) කුලී | 15,625 | 4,976 | 8,294 | 2,881 | 7,730 | 6,512 | 2,766 | 1,959 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,851 | 5,051 | 1,080 | - | 1,103 | 915 | 750 | - |
| (iv) වෙනත් ආදායම් | 8,160 | 12,070 | 6,891 | 10,906 | 8,556 | 1,95 | 6,471 | 6,585 |

2.2.2 වරිපනම් බදු

වරිපනම් කොට්ඨාශ 07 කට අදාළව හිඟහිටි වරිපනම් බදු රු.10,009,718 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 කුලී

ලැබිය යුතු කඩ කාමර කුලී රු. 1,917,004 ක් වර්ෂ 07 කට ආසන්න කාලයක සිට හිඟව පැවති අතර, එම හිඟ කුලී අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2016 හා 2017 වර්ෂයන්ට අදාලව මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදල් හඳුනා ගෙන අයකර ගැනීමට 2018 අගෝස්තු 01 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 11 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 අනුව 2017 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

සභා බල ප්‍රදේශය තුළ මාසිකව කසළ ටොන් 150 ක් පමණ බැහැර කරනු ලබන අතර, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට අනුව කසළ බැහැර කිරීම සිදු කර නොතිබුණි.මේ හේතුවෙන් එම ප්‍රදේශයේ ගැවසෙන වන සතුන් කසළ ආහාරයට ගැනීම ඇතුළු පාරිසරික ගැටළු ගණනාවක් නිර්මාණය වී තිබුණි. කෙසේ වුවද, කසළ කළමනාකරණය සඳහා මහවැලි අධිකාරිය විසින් අක්කර 12 1/2 ක ඉඩමක් සූරියපුර ප්‍රදේශයෙන් ලබා දී තිබුණද, වන සතුන්ට එල්ල වී ඇති තර්ජනය ඉවත් කිරීම පිණිස භූමිය වටා විදුලි වැටක් සවිකර විධිමත්ව කසළ බැහැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් 2018 අගෝස්තු 01 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) පාරිසරික ගැටළු

--------------------

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පාරිසරික හානි සිදු වන වී මෝල්, වඩු කර්මාන්ත සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ආයතන ආදී ව්‍යාවසායන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වුවත් සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන එවැනි ව්‍යාවසායන් 84 ක් එම බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කර්මාන්ත පවත්වා ගෙන යමින් තිබුණි. මේ සම්බන්ධයෙන් ඇති විය හැකි පාරිසරික ගැටළු නිරාකරණය කිරීමට සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

සභාව විසින් 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ ඇතුළත් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්ණායක හඳුනාගෙන නොතිබුණු අතර ඒ පිළිබඳ ප්‍රමාණවත් දැනුවත්භාවයක් නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු රථවාහන 13 ක් සඳහා ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ආ) 1993 නොවැම්බර් 18 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කර ඇති සැලසුම් චක්‍රලේඛ අංක 15 අනුව අනවසර ඉදිකිරීම් සඳහා වූ සේවා ගාස්තු අය කිරීම් ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමක් විවෘත කර එයට බැර කළ යුතු වුවත්, සභාව විසින් රු. 1,084,980 ක් පොදු ගිණුමේ තැන්පත් කර තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
-------------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ සේවයේ නියුතුව සිට සේවය හැරගිය හා සේවයෙන් ඉවත්කළ සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.1,117,824 ක් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ)

i. රියදුරු, මුරකරු සහ පුස්තකාල සේවා සහායක තනතුරුවල සේවකයන් 06 කගේ අතිරික්තයක් පැවතිණි.

ii. සංවර්ධන නිලධාරී, ආදායම් පරීක්ෂක, යන්ත්‍ර ක්‍රියාකරු සහ වැඩ පරීක්ෂක තනතරුවල සේවකයන් 06 කගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට 2018 අගෝස්තු 01 දින වන විටද කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පොදු වෙළඳපලෙහි ඉහළ මහල වෙත ප්‍රවේශ වීමට අපහසුවීම හා එම කඩ කාමරවල මාසික කුලිය ඉහළ අගයක් ගැනීම යන කරුණු හේතුවෙන් කඩ කාමර 25 ක් කුලියට ලබා දීමට නොහැකිව නිෂ්කාර්යව පැවතීම නිසා සමාලෝචිත වර්ෂයේ දළ වශයෙන් රු.900,000 කට ආසන්න ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) 2017 වර්ෂය සඳහා පොදු වෙළඳපළෙහි කුලියට ලබා දී ඇති කඩකාමර 25 ක් සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබුණි. මේ හේතුවෙන් ඉදිරියේදී හිඟ මුදල් අයකර ගැනීමේ දී ගැටළුකාරී තත්ත්වයක් මතු විය හැකිව තිබුණි.

(ඇ) අග්බෝපුර පුස්තකාලයට අළුත් පොත්පත් නොමැතිවීම, සාමාජික සංඛ්‍යාව ඉහළ නැංවීමට කටයුතු නොකිරීම හා සනීපාරක්ෂක පහසුකම් නොමැතිවීම හේතුවෙන් පුස්තකාලය මඟින් ඵලදායී සේවයක් ප්‍රදේශයේ ජනතාවට ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

3.5 වත්කම් කළමනාකරණය
----------------------------
(අ) ඌණ උපයෝජිත වත්කම්
------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාවට අයත් වාහන 03 ක් ක්‍රියාවිරහිතව වාහන අංගනයේ ගාල්කර තිබුණු අතර, එම වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග 2018 අගෝස්තු වන විටත් ගෙන නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ අනුග්‍රහයෙන් 2014 වර්ෂයේ සිට පවත්වා ගෙන යනු ලැබූ නැණසල පරිගණක මධ්‍යස්ථානය 2015 වර්ෂයේ සිට වසා දමා තිබුණි. මේ හේතුවෙන් මධ්‍යස්ථානයේ ඇති පරිගණක, ගෘහ භාණ්ඩ සහ

අනෙකුත් උපකරණ නිශ්කාර්යව පැවති අතර, ග්‍රාමීය ප්‍රදේශයන්හි දරුදැරියන්ට සන්නිවේදන තාක්ෂණ දැනුම ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

2018 මාර්තු 27 දිනැති වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව භාණ්ඩ වර්ග 09 ක් අළුත්වැඩියා කිරීමට, භාණ්ඩ වර්ග 34 ක් විකිණීමට සහ භාණ්ඩ වර්ග 28 ක් සහ පොත් 77 ක් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග 2018 අගෝස්තු 01 දින වන විටත් ගෙන නොතිබුණි.

3.6 ප්‍රසම්පාදනය

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 ට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.6.2 ප්‍රජා මණ්ඩල වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම

2013 ජූලි 26 දිනැති අංක FC/3/3/2013 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධාන සඳහා ලබා දිය හැකි උපරිම කොන්ත්‍රාත් වටිනාකම රු.2,000,000 ක් වුවත් ප්‍රජා සංවිධාන 04 ක් වෙත චක්‍රලේඛයට පටහැනිව කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි.

3.6.3 ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

2016 වර්ෂයේ දී සභාව විසින් ආරම්භ කර තිබූ එකතුව රු.1,528,508 ක් ඇස්තමේන්තු වටිනාකමකින් යුත්, 93 හන්දියේ සතිපොළ අළුත්වැඩියා කිරීම හා කන්තලේ වැව් බැම්ම අසල පොදු වැසිකිළිය අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 93 හංදිය සතිපොළ අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ප්‍රජා සංවිධානයක් වෙත 2016 අගෝස්තු 10 දින රු. 999,224 ක් වටිනා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ප්‍රජා සංවිධානය වෙත රු. 436,074 ක් ගෙවා තිබුණද 2018 අගෝස්තු 01 දින වන විටත් වැඩ නිමකර නොතිබුණි.

(ආ) කන්තලේ වැව නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් වැව් බැම්ම අසල පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු. 529,284 ක ඇස්තමේන්තු වටිනාකමක් මත අලුත්වැඩියා කටයුතු ආරම්භ කර තිබුණි. ජල සැපයුම ලබා ගැනීම සහ වැසිකිලි පද්ධතියේ ඇතුලත නිම කිරීම 2018 අගෝස්තු 01 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම හා වියදම සහ තත්‍ය ආදායම හා වියදම අතර සියයට 4 සිට සියයට 214 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි. ඒ අනුව වාර්ෂික අයවැය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | වත්කම් ගිණුම් තැබීමේ අඩුපාඩු පැවතීම. |
| | | (ii) | උපයෝගි ලෙජර් පවත්වා ගෙන නොතිබීම. |
| (ආ) | ආදායම් පරිපාලනය | | හිඟ ආදායම් අයකර නොගැනීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | වත්කම් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| | | (ii) | නිෂ්කාර්ය වත්කම් ඵලදායී කාර්යන්වල යෙදවීමට කටයුතු නොකිරීම. |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | | ගිවිසුමට අනුකූලව කාර්යයන් ඉටු කිරීමෙන් පසු ගෙවීම් කිරීම. |
| (ඉ) | මානව සම්පත් කළමනාකරණය | | අතිරික්ත සේවකයන් බඳවා ගෙන තිබීම |